**27-03-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබලා ඥාන සාගරය වන පියා තුළින් මාස්ටර් ඥාන සාගර වී ඇත. ඔබ හැම කෙනාටම ඥානය නමැති තුන්වැනි ඇස ලැබී ඇත. එමනිසා, ඔබලා ත්‍රිනේත්‍රී, ත්‍රිකාල දර්ශී සහ ත්‍රිලෝකනාථ වේ.

**ප්‍රශ්නය:** ඔබ දරුවන් හැර වෙන කිසිවෙකුට ලොවට අධ්‍යාත්මික සේවය කළ නොහැක. එයට හේතුව කුමක්ද?

**පිළිතුර:** උත්තරීතර ජීවයෙන් බලය ලබන්නේ ඔබ පමණි. ඔබ ජීවයන් පළමුවෙන්ම උත්තරීතර ජීවයෙන් ඥාන එන්නත ලබා, ඒ තුළින් පස් පව් වලින් ජය ගෙන අන් අයටද එසේ කිරීමට උදව් කරයි. අන් කිසිවෙකුට එවැනි සේවයක් කළ නොහැක සෑම චක්‍රයේම මෙම ආධ්‍යාත්මික සේවය කරන්නේ ඔබ දරුවන් පමණි.

ඕම් ශාන්ති. ඔබ පියා ස්මරණය කරමින් අසුන් ගෙන සිටිය යුතුය. ඔබ ශාරීරික අයව ස්මරණය කරමින් නොසිටිය යුතුය. අළුතෙන් පැමිණෙන අය පරමාත්ම පියා නොදනී. ඔහුගේ නම ඉතා පහසුය ශිව බාබා. දරුවන් පියා හඳුනා නොගැනීම විශ්මයකි! උසස්ම උසස්, සියලු දෙනාටම මුක්තිය ලබා දෙන්නා ශිව බාබාය. ඔහු සියලුම අපවිත්‍ර අය පවිත්‍ර කරවයි ඔහුට සියලු දෙනාගේම දුක නැති කරන්නා යැයි ද කියති. කෙසේවෙතත්, බ්‍රහ්ම කුමාරීන් වන ඔබ හැර අන් කිසිවකු ඔහු කවුරුන්දැයි නොදනිති. ඔබලා ඔහුගේ මුණුපුරන් හා මිණිපිරියන් වෙති. එමනිසා, ඔබලා නිසැකවම ඔබේ පියා සහ ඔහුගේ නිර්මාණයේ මුල, මැද සහ අග දනී. දරුවන් සියලු දේම දැන ගන්නේ පියාගෙනි. මෙය අපවිත්‍ර ලෝකයයි. ඔහු යකඩ යුගයේ සියලුම අපවිත්‍ර අය ස්වර්ණමය යුගයේ අය වැනි කරවන්නේ කෙසේදැයි බ්‍රහ්ම කුමාරීන් හැර කිසිවෙකු නොදනී. යකඩ යුගයේ පරිහාණියෙන් ඔබව ගලවා, ස්වර්ණමය යුගයේ මෝක්ෂය ලබා දෙන්නේ පරමාත්ම පියා පමණි. ඔවුන් ශිවාගේ උපන් දිනය සමරන්නේ භාරතයේ පමණි. ඔහු නිසැකවම පැමිණෙන නමුත්, භාරතයේ මිනිසුන් ඔහු දෙන්නේ කුමක්දැයි නොදනී. සෑම වර්ෂයකම මිනිසුන් ශිවාගේ උපන් දිනය සමරති, එහෙත් ඔවුනට ඥානයේ තෙවැනි ඇස නොමැත. ඔවුන් පියා නොදන්නේ මේ නිසාය.

**ගීතය:** අහෝ දෙවියනි අන්ධ අපට මඟ පෙන්වන්න!

මනුෂ්‍යයන් විසින් රචනාකර ඇති මෙම ගීතයෙන්, ඔවුන් අන්ධ බව කියති. සියලු දෙනාටම භෞතික ඇස් ඇත, එසේ නම් ඔවුන් අන්ධ යැයි කියන්නේ මන්ද? කිසිවෙකුට ඥානය නමැති තුන්වැනි ඇස නොමැති බව පියා මෙතැන හිඳ පවසයි. පියා නොදත්කම අඥානකමකි! පියාගෙන්ම පියාව හඳුනා ගැනීම ඥානයයි. නිර්මාණයේ මුල, මැද හා අග පිළිබඳ දැන ගැනීමට පියා ඔබ සෑම කෙනෙකුටම ඥානයේ තෙවැනි ඇස ලබා දෙයි. ඥාන සාගරයේ දරුවන් වන ඔබලා අධිපති ඥාන සාගරයන්ය. තුන්වන ඇස ලැබීම යනු ඔබලා ත්‍රිනේත්‍රී, ත්‍රිකාල දර්ශී සහ ත්‍රිලෝකනාථ වීම වේ. ස්වර්ණම යුගයේ අධිපතිව සිටි ලක්ෂ්මී සහ නාරායන, ඔවුන්ගේ උරුමය කෙසේ ලබා ගත්තේ දැයි භාරතයේ ජනයා නොදනිති. ඔවුන් පැමිණියේ කවදාද? ඔවුන් කොහි ගියේද? ඔවුන්ගේ රාජධානිය ඔවුන් ලැබුවේ කෙසේද? මේ කිසිවක් ජනයා නොදනී. දේවතාවරු පාරිශුද්ධය. නිසැකවම ඔවුන්ව පාරිශුද්ධ කරවන්නේ පරමාත්ම පියා පමණි. දේවතාවරුන්ව සහ පියා විශ්වාස කරන, ඔබ භාරත ජනයාට පියා මෙතැන හිඳ විස්තර කරයි. ශිවාගේ උපත සිදු වූයේ භාරතයේය. උසස්ම උසස් කෙනා පරමාත්ම දෙවියන්ය. පියාගේ උපන් දිනය සමරන්නේ මෙහිදීය. ජගදම්බා සහ ජගත් පිතා ගේ, සරස්වතී සහ බ්‍රහ්මා ගේ උපතද මෙහි දී සිදුවීය මේවා සැමරුවේ භාරතයේ පමණි. අච්චා. ලක්ෂ්මී සහ නාරායන ද මෙහි උපත් ලබති ඔවුන් රාධේ සහ ක්‍රිෂ්ණාය. භාරතයේ ජනයා මෙයවත් තේරුම් නොගනී. ඔවුන් පවසයි අහෝ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණෙන්න! එමනිසා, සියලු දෙනාම නිසැකවම අපිරිසිදුය. සාන්තුවරයන්, පූජකවරුන්, රිෂිවරු සහ මුනිවරු යන සියලු දෙනාම පැමිණ අපව පාරිශුද්ධ කරන්න යැයි අඬ ගසති. අනෙක් අතට, ඔවුන් ගංගානම් ගඟ පාරිශුද්ධකරුවා යැයි විශ්වාස කරන නිසා, ඔවුන්ගේ පව් සෝදා හැරීමට කුම්භ මේලාවට යති. පාරිශුද්ධකරුවාට පැමිණ ඔවුන් පාරිශුද්ධ කරන්න යැයි අඬ ගසන මුත්, මනුෂ්‍යයෙකු කිසිවෙකු පාරිශුද්ධ කරන්නේ කෙසේද? පරම පියා පහදා දෙයි ඔබලා පළමුවෙන්ම දේවතා ධර්මයට අයිතිව සිටි කල, ඔබ සියලු දෙනාම පාරිශුද්ධව සිටි නමුදු, ඔබලා දැන් අපවිත්‍රය. දෙවියනි, අපට මඟ පෙන්වන්න!

යැයි ඔවුන් පවසති. මඟ පෙන්වන්නේ කොතැනටද? 'බාබා අපට ජීවන මුක්තියේ මඟ පෙන්වන්න! අප තුළ පස් පව් ඇත. බාබා, අප දෙව්ලොව සිටි කල අප පාපයෙන් තොර විය. අප දැන් පාපකාරී හා අපිරිසිදු වී ඇත අපට මෙහි රහස කියන්න.' යැයි ඔවුන් කියති. මේවා බොරු කතන්දර නොවේ. පියා පහදා දෙයි ශ්‍රීමත් භගවත් ගීතාව වූ කලී දෙවියන් විසින් ගායනා කළ ගීතාව වේ. අපිරිසිදු අය පාරිශුද්ධ කරන එකම කෙනා අශාරීරික දෙවියන්ය. මනුෂ්‍යයින්ට දෙවියන් යැයි කිව නොහැක. පියා පවසයි මෙහි බොහෝ උසස් ගුරුන් සිටියත්, භාරතය අපවිත්‍රව සිප්පි කටුවක් මෙන් වී ඇත්තේ මන්ද? භාරතය දෙව්ලොවක් වී සිටීම ඊයේ වාගේය. බාබා භාරතයට දෙව්ලොව තිළිණය දුනි. ඔහු පැමිණ රාජයෝගා උගන්වා භාරතයේ අපවිත්‍ර ජනයා පවිත්‍ර කළේය. පියා නැවත වරක් දරුවන් වෙත ඔවුන්ගේ සේවකයා ලෙස පැමිණ ඇත. පියා ආධ්‍යාත්මික සේවකයායි. සියලුම මනුෂ්‍යයින් භෞතික සේවකයින්ය. සන්‍යාසීන් පවා භෞතික සේවකයින් වේ. ඔවුන් වාඩි වී ආගමික ග්‍රන්ථ ආදිය කියවයි. පරම පියා පවසයි අශාරීරික වන මම, භෞතික සාමාන්‍ය මහළු ශරීරයකට ඇතුළු වී ඔබ දරුවන්ට පහදා දෙමි අහෝ භාරතයේ දරුවනි! බලන්න! ආධ්‍යාත්මික පියා මෙහි හිඳ ජීවාත්මයන්ට පහදා දෙයි. මෙය පවසන්නේ බ්‍රහ්මා නොව, මෙම ශරීරය ආධාරකය කරගත් අශාරීරික පියාය. ශිවාට ඔහුටම කියා ශරීරයක් නොමැත. සලිග්‍රම් ජීවයන්ට ඔවුන්ගේම ශරීර ඇත. නැවත උපත් ගැනීමෙන් ඔවුන් අපවිත්‍ර වෙයි. දැන් මුළු ලොවම අපවිත්‍රය එකම කෙනෙකුවත් පවිත්‍ර නැත. ඔබ සතෝප්‍රධාන්ව සිට මිශ්‍ර වී සතෝ, රජෝ, ඉන්පසු තමෝ තත්ත්වයන් තුළින් ගියේය. ශිව බාබා භාරතයේ ජනතාව වෙත පැමිණ භාග්‍ය රථය නම් වූ ශරීරය ගනියි. ශිවා සහ ශන්කර් දෙදෙනාම සම්බන්ධ විය යුතුයැයි යන විශ්වාසයෙන් ඔවුන් දේවාලවල ශන්කර්ගේ පිළිරුවක් පෙන්වා ඇත. ශිවා අශාරීරික බවත්, ශන්කර් සූක්ෂම වන බවත් ඔවුන් තේරුම් නොගනී. ශිවා හා ශන්කර් එකතුවන්නේ කෙසේද? අච්චා, එවිට ගොනා පිට යන්නේ කවුද? ශිවාද? හෝ ශන්කර්ද? සූක්ෂම දේශයෙහි ගොනෙකු එන්නේ කොහි සිටද? ශිවා වාසය කරන්නේ අශාරීරික ලොවෙහි වන අතර, ශන්කර් සූක්ෂම දේශයේ වෙසෙයි. සියලුම ජීවාත්මයන් අශාරීරික ලොව වෙසෙති. සූක්ෂම දේශයේ බ්‍රහ්මා, විෂ්ණු සහ ශන්කර් පමණක් සිටිති. එහි සත්වයින් නොමැත. මම සාමාන්‍ය මහළු ශරීරයකට ඇතුළු වී ඔබලාට පහදා දෙමි යැයි පරමාත්ම පියා පවසයි. ඔබ දරුවන් ඔබගේම උපත් නොදනී. ස්වර්ණම යුගයේ සිට ඔබ කොපමණ උපත් ගෙන තිබේද? ඔබ උපත් 84 ක් ගෙන ඇත. මෙය දැන් ඔබගේ අවසාන උපතයි. පවිත්‍ර අමරණීය දේශය වූ භාරතය දැන් අපවිත්‍ර මරණයේ දේශය වී ඇත. සියලු දෙනාම ගලවන්නා ඒකායන කෙනා වේ. රුද්‍රාගේ ජපමාලය වූ කලී උත්තරිතර පියා, උත්තරිතර ජීවය වන අශාරීරික පියාගේ ජප මාලයයි. රුද්‍රාගේ ජපමාලය ශ්‍රී ශ්‍රී 108 යැයි කියති. සියලු දෙනාම ශිවාගේ ගෙලේ මල් දාමයේ කොටසකි. එමනිසා, පාරිශුද්ධකරුවා, සියලු දෙනාටම ගැලවීම ලබාදෙන්නා සහ සැමටම ඔහුගේ උරුමය දෙන එකම කෙනා පරමාත්ම පියාය. භෞතික පියෙකුගෙන් සීමිත උරුමයක් ලැබේ. සන්‍යාසීන් සතුට, කපුටෙකුගේ පැහැරීමක් ලෙස සලකති. පියා පවසයි ඔබගේ එම සතුට සැබවින්ම කපුටෙකුගේ පැහැරීමක් වැනිය. පරම පියා පමණයි පැමිණ අපවිත්‍ර අයව පාරිශුද්ධ කරවන්නේ, එනම්, ඔහු ඥානය තුළින්, කටු මල් බවට වෙනස් කරයි. මෙය ගීතාවේ ඥානයවේ. කිසිම මනුෂ්‍යයෙකුට මේ ඥානයපැහැදිලි කළ නොහැක. එය පහදා දිය හැක්කේ ඥාන සාගරය, පාරිශුද්ධකරු වන පරමාත්ම පියාට පමණි. ඔබ දැන් ලබන උරුමය ලබාගත හැක්කේ පියාගෙන්ම පමණි. ඔබලා පමණක් ගැලවීම ලබති. අන් අය යකඩ යුගයේ වන අතර, ඔබලා සංගම යුගයේය. මෙය දැන් යකඩ යුගයේ අවසානයයි. මහා භාරත යුද්ධය ඔබ ඉදිරියේය. වසර 5000 කට පෙර ඔබලා රාජයෝගා ඉගෙන ගත් පසු පිදුරුගොඩ දැල්වීය. ඔබලා දැන් ලක්ෂ්මී සහ නාරායන වීමට රාජයෝගා ඉගෙන ගතිති. අන් සියල්ලම භක්ති මාර්ගයේය. පියා පැමිණි විට ඔහු දෙව්ලොවට දොරටුව විවෘත කරයි. ඔබ ශිව ශක්තීන්, භාරත මාතාවන් ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් භාරතය දෙව්ලොවක් කරති. ඔබ ශිවාගේ දරුවන්ය. ඔබ ඔහුව සිහි කරයි. ඔබ ශිවාගෙන් බලය ගෙන පස් පව් වන සතුරා ජය ගනී. ඔබ දරුවන් මීට වසර 5000 කට පෙරද භාරතයට අධ්‍යාත්මික සේවය කළහ. එම සමාජ සේවකයන් භෞතික සේවා කරති. මෙය ආධ්‍යාත්මික සේවයයි. උත්තරීතර ජීවය පැමිණ, ඔබ ජීවයන්ට එන්නතක් දෙයි ඔහු ඔබට උගන්වයි. සවන් දෙන්නේ ජීවාත්මයයි. ඔබලා ජීවාත්මයන් වන අතර ඔබ උපත් 84 ක් ගනී. ඔබ එක් ශරීරයක් අතහැර තව එකක් ගනී. උපත් 84 හි ඔබලාට දෙමාපියන් 84 කි. ඔබලා ස්වර්ණම හා රිදී යුගයන්හී දෙව්ලොව සැපත ලැබූහ. ඔබලා නැවත වරක් අසීමිත පියාගෙන් සතුටේ උරුමය ලබති. සත්‍යයෙන්ම භාරතයට මෙම උරුමය ලැබුණි. භාරතයෙහි ලක්ෂ්මී සහ නාරායනගේ රාජධානිය විය. එහි යක්ෂයන් ආදින් නොවීය. දැන් මෙම පැරණි ලොවට ගිනි දැල්වෙන බව ඔබට වැටහෙයි. මම පැමිණ ඥානයේ යාග ගින්න නිර්මාණය කරමි. ඔබ සියලු දෙනාම පාරිශුද්ධ දේවතාවරු බවට පත්වෙයි. ඔබලාගෙන් දහස් ගණනින් දේවතාවරු වීමට උත්සාහ ගනිති. පරමාත්ම පියා පැමිණ ඇත්තේ ඔබ දරුවන්ට මුක්තිය ලබාදීමටයි. ඔහු ඔබව කටු වලින් මල් බවට පත්

කරවයි. මුළු නාටකයම සහ ශිව බාබා රහපාන කොටස වටහා ගැනීමට ඔහු ඔබට තුන්වැනි ඇස නමැති ඥානය දෙයි. බ්‍රහ්මා සහ විෂ්ණු අතර සම්බන්ධයද ඔබට වැටහෙයි. බ්‍රහ්මා, විෂ්ණුගේ පෙකනියෙන් මතුවුණු බව පෙන්වයි. බ්‍රහ්මා විෂ්ණු වෙයි අනතුරුව බ්‍රහමින්වරුන් දේවතාවරුන් බවට පත්වෙයි. විෂ්ණු හට බ්‍රහ්මා වීමට වර්ෂ 5000 ක් ගතවෙයි. ඔබට මෙම ඥානය තිබේ. විෂ්ණු දේශය මතුවන්නේ ඔබ බ්‍රහමින්වරුන්ගේ නෙළුම් පෙකනියෙනි. ඔවුන් බ්‍රහ්මා විෂ්ණුගේ පෙකනියෙන් එන්නා වූ පිංතූරයක් නිර්මාණය කර, සියලුම වේද සහ ආගමික ග්‍රන්ථ වල සාරය කියවයි. ඔබ දැන් බ්‍රහ්මා තුළින් මුළු සාරයම වටහා ගනී. ප්‍රධාන ආගමික ග්‍රන්ථ 4 ක් ඇතැයි පරමාත්ම පියා පවසයි. පළමුවෙනි දේවතා ධර්මයේ ග්‍රන්ථය ගීතාව වේ. ගීතාව ගායනා කළේ කවුද? ශිව බාබාය. ඥානයේ මහා සාගරය, පාරිශුද්ධකරුවා, සතුටු සාගරය ශිව බාබාය. භාරතය දෙව්ලොවක් කළේ ක්‍රිෂ්ණා නොව, ඔහුය. ක්‍රිෂ්ණා මගෙන් දැනුමට සවන් දී, ක්‍රිෂ්ණා බවට පත් විය. එමනිසා, මෙය අදෘශ්‍යමානය, නොවේද? අළුත් දරුවන්ට මෙම කරුණු වටහා ගැනීමට නොහැකිය. මෙයට අපාය යැයි කියන අතර, එයට කියන්නේ දෙව්ලොව කියාය. ශිව බාබා දෙව්ලොව ස්ථාපනය කළ අතර ලක්ෂ්මී සහ නාරායන එහි පාලනය ගෙන යන්නට විය. ඔබ දැන් මනුෂ්‍යයින්ගෙන් දේවතාවරුන් බවට පත්වෙමින් සිටී. දුකෙහි දේශය වන මෙම මරණ දේශයේ ඔබගේ අවසාන උපත මෙය වේ යැයි පරමාත්ම පියා පවසයි. භාරතය අමරණීය දේශයව තිබුණි. එහි දුකක සඳහනක්වත් නොවීය. භාරතය සුර දූතයින්ගේ දේශය විය දැන් එය සොහොන් බිමක් වී ඇති අතර නැවතත් එය සුර දූතයින්ගේ දේශය වෙයි. මෙම සියලුම කරුණු වටහා ගත යුතුය. මෙය මනුෂ්‍යයින් දේවතාවරුන් බවට වෙනස්කරන්නා වූ ඉගෙනුම ලබන තැනයි. මෙය සන්‍යාසීන් වාඩිගෙන ග්‍රන්ථ තේරුම් කර දෙන අධ්‍යාත්මික රැස්වීමක් නොවේ. නවකයෙකුට, සත් දින පාඩම් මාලාව ඔහු නොගත්තේනම්, මේ කිසිවක් වටහා ගැනීමට නොහැකිවනු ඇත. මෙකල සියලු මනුෂ්‍යයන් භක්තිවන්තයන්ය. එම ජීවයන් පියා සිහි කරති. සියලුදෙනාම එකම ආදරවන්තයා වන පරමාත්ම දෙවියන්ගේ ආදරවන්තයන්ය. පියා පැමිණ සත්‍යයේ දේශය ස්ථාපනය කරයි. චක්‍රයේ අඩකට පසුව රාවන් පැමිණ එය මුසාවේ දේශය බවට පත්කරවයි. මෙය දැන් සංගම යුගයයි. මෙම සියලුම කරුණු වටහා ගත යුතුය. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පියාගේ ශ්‍රීමත් අනුගමනය කර සත්‍යයෙන්ම භාරතයට අධ්‍යාත්මිකව සේවය කරන්න. සර්ව බලධාරී ආධිපත්‍ය බලය පරමාත්ම පියාගෙන් ගෙන පස් පව් නමැති ඔබේ සතුරා ජය ගන්න.
2. මනුෂ්‍යයන්ගෙන් දේවතාවන් බවට පත්වීමට නිසැකවම පවිත්‍ර වන්න. ඥානය ධාරණය කර, කටුවකින් මලක් බවට පත්වී, අන් අයටද එසේ වීමට උදව් කරන්න.

**වරදානය:** ඔබට සූක්ෂ්ම ආලෝක ස්වරූපයක් තිබී, විනාශ කාලයේදි ඔබගේ ප්‍රශ්න පත්‍රයෙන් ඔබ සමත් වේවා.

විනාශ කාලයේදි ඔබගේ ප්‍රශ්න පත්‍රයෙන් සමත් වී සියළු අහිතකර සිදුවීම් වලට මුහුණ දීම සඳහා සූක්ෂ්ම ආලෝක ස්වරූපයක් ඇති අයෙක් වන්න. ඔබ ජංගම ප්‍රදීපාගාරයක් වන විට ඔබගේ භෞතික ස්වරූපය නොපෙනෙයි. එය හරියට ඔබගේ චරිත කොටස රගපෑමට ඔබ වස්ත්‍රයක් පලඳින අතර, ඔබගේ කොටස අවසන් වූ සැනින් ඔබ එය ගලවා දමන සේය. තත්පරයකදි එය පලඳින්න, ඉන්පසුව තත්පරයකදි එය ගලවා දමන්න, එනම් ඉන් වෙන් වන්න. ඔබ මෙය පුහුණු කරන විට ඔබව දකින අන් අයට පෙනෙන්නේ ඔබ ආලෝකමත් වස්ත්‍රයක් ඇඳ සිටින බව සහ ආලෝකය ඔබගේ සැරසිල්ල බවයි.

**පාඨය:** ඔබ නිරතුරුවම ඔබගේ උනන්දුව සහ උද්යෝගයේ පියාපත් පැලඳ සිටින විට ඔබ සිදු කරන සෑම කාර්යයකින්ම ඔබට පහසුවෙන් සාර්ථකත්වය ලැබෙයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබගේ විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් කරගෙන නිරන්තරයෙන් නොබියව සහ සැහැල්ලුවෙන් රැදී සිටින්න.**

පරමාත්ම පියා සර්ව බලධාරියාය, එබැවින් ඔහුගේ අත අල්ලා ගැනීමෙන් ඔබ ඔබගේ ගමනාන්තයට ලගා වන බවට විශ්වාසය ඇති කරගන්න. ඔබ දුර්වල වුනත් ඔබගේ සහකරු ශක්තිමත් නොවේද? එබැවින් ඔබ නියත වශයෙන්ම එතෙර වෙයි. ඔබ බුද්ධියේ විශ්වාසය ඇති ජයග්‍රාහී මැණිකක් බව නිරන්තරයෙන් අවධානයේ තබා ගන්න. අතීතය, අතීතයේම තබා, නැවතීමේ තිතක් තබා ඉදිරියට ගමන් කරන්න.

**මාතේශ්වරීජීගේ අමිල ශ්‍රේෂ්ඨ වදන්**

**1) ජීවාත්ම සහ පරමාත්ම ජීවය අතර වෙනස.**

ජීවාත්ම සහ පරමාත්ම ජීවය, බොහෝ කලක් වෙන්ව සිටි අතර සත්ගුරුට ඒජන්තව මුණගැසුණු විට, සුන්දර හමුවක් සිදුවිය. අප මෙම වදන් පවසන විට, ඒවායේ නිවැරදි අරුත වන්නේ, ජීවාත්ම, පරමාත්ම ජීවයෙන් බොහෝ කලක් වෙන්ව සිටි බවයි. දීර්ඝ කාලයක් පුරා යනු, ජීවාත්ම දීර්ඝ කාලයක් පරමාත්ම ජීවයෙන් වෙන්ව සිටි බවයි. ජීවාත්මයන්ට සහ පරමාත්මයට වෙන්වූ අනන්‍යතාවන් තිබෙන බවත් ඔවුන් අතරේ පැහැදිලි වෙනසක් ඇති බවත් මේ වදන් වලින් ඔප්පු වෙයි. කෙසේවෙතත්, ලෞකික මිනිසුන් මෙය හඳුනාගන්නේ නැති නිසා, ඔවුන් මෙම වදන් වටහා ගන්නේ මේ ආකාරයටයි මා වන ජීවාත්මය, පරමාත්ම ජීවයයි. එබැවින් ජීවාත්ම, මායාගේ දූහුවිලි වලින් වැසී ඇති නිසා, ඔවුන්ට තම ආදිතම ස්වරූපය අමතක වී ඇත. එබැවින් ඔවුන් පවසන්නේ, මායාගේ දූහුවිලි ඉවත් කළ විට, සෑම ජීවයක්ම පරමාත්මය වන බවයි. ඉතිං, ඔවුන් මේ ආකාරයට ජීවාත්ම වෙනස් බව සලකයි. ජීවාත්මය, පරමාත්මය බව මිනසුන් පවසන විට, ඔවුන්ට ඇති අනෙක් මතය වන්නේ, ජීවාත්මයන්ට තමන්ව අමතක වී ඇති නිසා, ඔවුන් දුකට පත්ව ඇති බවයි. ජීවාත්මයක් තමන්ව හැඳිනගෙන, පිවිතුරු වන විට, එම ජීවාත්මය පරමාත්මය සමග මුසු වී එක්කෙනෙක් බවට පත් වෙයි. ඉතිං, ඔවුන් මේ ආකාරයට ජීවාත්ම වෙන්ව සිටින බව සලකයි, නමුත් ජීවාත්ම සහ පරමාත්ම ජීවය, වෙනස් අනන්‍යතාවයන් බව අප දන්නවා. ජීවාත්මයකට, පරමාත්ම ජීවය බවට පත් විය නොහැකි සේම ජීවාත්මයකට පරමාත්ම ජීවය සමග මුසුවිය නොහැක, එමෙන්ම දූහුවිලි වලට පරමාත්ම ජීවය වසා දැමිය නොහැක.

**2) මනසේ අශාන්තියට හේතුව කර්ම බන්ධන වන අතර ශාන්තියේ පදනම වන්නේ කර්මතීට ස්ථිතියයි.**

ඇත්ත වශයෙන් සෑම මනුෂ්‍යයෙකුටම අවශ්‍ය වන්නේ මනසේ ශාන්තිය අත්කර ගැනීමටයි, මේ නිසයි ඔවුන් මේ වෙනුවෙන් බොහෝ ක්‍රමවේද නිර්මාණය කර තිබෙන්නේ. කෙසේවෙතත්, කිසිම මනසක් තවම ශාන්තිය අත්කර නොගැනීමට සැබෑ හේතුව කුමක්ද? ප්‍රථමයෙන් මනසේ අශාන්තියට මුල් වන ප්‍රථම හේතුව කුමක්ද කියා සිතීමට අවශ්‍යයි. මනසේ අශාන්තියට ප්‍රධාන හේතුව වන්නේ කර්ම බන්ධනයක සිරගත වී සිටීමයි. පංච පාපයන්ගේ කර්ම බන්ධන වලින් මනුෂ්‍යයන් නිදහස් වන තුරු ඔවුන්ට අශාන්තියෙන් නිදහස් විය නොහැක. ඔබගේ කර්ම බන්ධන බිඳී ගිය විට, ඔබ මනසේ ශාන්තිය අත්කර ගන්නවා, එනම්, ඔබට ජීවන-මුක්තිය අත්කරගත හැක. ඔබගේ කර්ම බන්දන ඔබ සිඳලන්නේ කෙසේද කියා ඔබ දැන් සිතා බැලිය යුතුයි. ඔබව ඒවායෙන් මුදවා ගත හැක්කේ කාටද? කිසිම මනුෂ්‍ය ජීවාත්මයකට, තවත් ජීවාත්මයක් මුදවා ගත නොහැකි බව අප දන්නවා. කර්ම ගිණුම් වල කර්ම බන්දන සිඳලිය හැක්කේ පරමාත්ම ජීවයට පමණයි. පරමාත්ම දෙවියන්, සතුට දානය කරන්නා ලෙස හැඳින්වෙන්නේ, පැමිණ අපව යෝගා බලයෙන් කර්ම බන්ධන වලින් නිදහස් කරන්නේ ඔහු පමණක් බැවින්ය. ඔබ ජීවාත්මයක් බවත් ඔබ සැබවින්ම කාගේ දරුවෙක්ද සහ ඔබගේ ආදිතම ගුණධර්ම මොනවාද යන ඥානයඔබට තිබෙන තුරු, මේ සියල්ල ඔබගේ බුද්ධිය තුළ තිබෙන විට කර්ම බන්ධන බිඳ දැමිය හැක. අපට මෙම ඥාන මිණි මුතු ලැබෙන්නේ පරමාත්ම දෙවියන්ගෙන් පමණයි, එනම්, කර්ම බන්ධන බිඳ දැමිය හැක්කේ පරමාත්ම දෙවියන් විසින්ම පමණයි. අච්චා.